**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරය - 2014**

-------------------------------------------------------------------------------------------

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 ජූනි 03 දිනැති අංක අමප/10/0958/438/001 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**කළමනාකරණ භාරය පිහිටුවීම**

-----------------------------------

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් 2010 මැයි 14 දින ඉදිරිපත් කරන ලද පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරය පිහිටුවීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2010 ජූනි 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එකී තීරණය ප්‍රකාරව කළමනාකරණ භාරය පිහිටුවා තිබුණ ද 2015 නොවැම්බර් 30 දක්වාම ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිගත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (**ISSAI** 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කළමනාකරණ භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කළමනාකරණ භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව වත්කම් වල ධාරණ අගය නිශ්චය කිරීමේදී අනාගත අවිනිශ්චිත සිදුවීම් වල බලපෑම ඇස්තමේන්තු කළ යුතු වුවද, රු.49,433,863 ක් වූ ලැබිය යුතු කඩ කුලී ආදායම මත ඇතිවිය හැකි බොල් ණය සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව වත්කමක් භාවිතයට ගතහැකි තත්ත්වයට පත්කල අවස්ථාවේ සිට ක්ෂය කිරීම ආරම්භ කල යුතු වුවද, ඊට පටහැනිව වර්ෂය ආරම්භයේ පැවැති ශේෂය පදනම් කරගෙන ක්ෂය ගණනය කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

අපද්‍රව්‍ය පිරිපහදු යන්ත්‍රාගාරයේ ගොඩනැගිලි පිරිවැය හා යන්ත්‍ර පිරිවැය වෙන වෙනම හඳුනාගෙන සුදුසු අනුපාත මත ක්ෂය කරනු වෙනුවට රු.38,078,646 ක් වූ යන්ත්‍ර හා ගොඩනැගිලි මුළු පිරිවැයට සියයට 5 බැගින් ක්ෂය කර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර සැපයුම්කරුවන්ට නිකුත් කිරීම සඳහා මිලදී ගෙන තිබූ රු.83,588 ක් වූ හැඳුනුම් පත්‍ර තොගයක වලංගු කාලය, 2012 අප්‍රේල් 30 දිනෙන් අවසන්ව තිබුණද, එය ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කිරීමකින් තොරව ලැබිය යුතු ශේෂයක් වශයෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල අපද්‍රව්‍ය පිරිපහදු යන්ත්‍රාගාරයේ (Treatment plant) අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වැය කරන ලද රු.194,208 ක්, වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ප්‍රාග්ධනගත කර තිබුණි.

(ඇ) දෝෂ සහගත ගණනය කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ ස්ථාවර තැන්පත් පොළී ආදායම හා වර්ෂය සඳහා ලැබිය යුතු පොළී ආදායම පිළිවලින් රු.803,924 ක් හා රු.408,414 කින් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. එසේම ස්ථාවර තැන්පත් පොළී ආදායමට අදාල රු.761,214 ක රඳවා ගැනීමේ බදු ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ රු.433,950 ක් වූ ප්‍රාග්ධන වියදම් අයභාර වියදම් වශයෙන් සටහන් කිරීමේ වරද, සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර තිබුණද එහි බලපෑම අතීතානුයෝගීව ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) තොග වෙළඳ සංකීර්ණයේ බිමට ස්ථාවර කාපට් ලෙස තීන්ත ආලේප කිරීම වෙනුවෙන් ඉකුත් වර්ෂයේ රු.3,244,760 ක් වැය කර එම වැය කළ මුදල් ප්‍රාග්ධන ගත කර තිබූ අතර එය ගුණාත්මක තත්ත්වයෙන් පැවතී තිබුණේ මාස 03 කට අඩු කාලයක් බැවින් ගිණුම්වල ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඊ) අවිනිශ්චිත කුලී ආදායම් රු.588,000 ක් මූල්‍ය ප්‍රකාශන තුළ වෙනම හෙළිදරව් කිරීම වෙනුවට ලැබිය යුතු කුලී ආදායමෙන් අඩුකර ශුද්ධ අගය පෙන්වා තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ණයහිමියෝ හා අනෙකුත් වගකීම් යටතේ ඉකුත් වර්ෂයේ සිට පැවතෙන සමාගම් 05 කට අදාල එකතුව රු.5,446,663 ක් වූ ශේෂයන් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරික්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | කළමනාකරණ භාර ලියවිල්ල 8 (9) | කළමනාකරණ භාර රැස්වීම් සෑම මාසයකට වරක් වත් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ රැස්වීම් 06 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 2 වගන්තිය | යොමුගත පනත ප්‍රකාරව "භාරය" ආදායම් බදු බැඳියාවට යටත් වුවද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

(ඇ) 2013 අංක 17 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත

| | | |
|---|---|---|
| (i) 10 වගන්තිය | | භාරය එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 22(2) වගන්තිය | (i) | භාරයේ යෙදවුම් බදු වෙනුවෙන් බදු බැර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) | යෙදවුම් මත ගෙවන ලද එකතු කළ අගය මත බදු මූල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරව් කර නොතිබුණි. |

(ඈ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| 3.2 මාර්ගෝපදේශය | තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ පිරිසිදු කිරීමේ සේවාව හා ආපනශාලාව පවත්වා ගැනීම පෞද්ගලික ආයතනවලට පවරා තිබුණි. එම ආයතන සමඟ පිළිවෙලින් 2012 පෙබරවාරි 14 දින සිට වර්ෂ 5 ක් සඳහා ද, 2011 අප්‍රේල් 01 සිට වර්ෂ 10 ක් සඳහා ද, වශයෙන් දීර්ඝ කාලීන ගිවිසුම්වලට ද එළඹ තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 4.1 ඡේදය | භාරයේ වාර්ෂික අයවැය ලේඛනය පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 ට පෙර අදාල ඇමතිවරයාගේ අනුමැතිය ලබාගෙන සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ලංකා ධීවර සංස්ථාවට ව්‍යාපාරික කටයුතු සඳහා ලබා දී තිබූ අයිස් යන්ත්‍රාගාරය හා වෙළඳසැල් 4ක් වෙනුවෙන් අයවිය යුතු රු.5,148,000 ක වාර්ෂික කුලී ආදායම කළමනාකරණ ගාස්තුවක් ලෙස හිලව් කිරීමට භාර මණ්ඩලය තීරණය කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු.27,815,592ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.25,873,482ක් විය. ඒ අනුව අරමුදලේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,942,110ක පිරිහීමක් දක්නට ලැබුණි. අලුත්වැඩියා හා නඩත්තු වියදම් සහ ආරක්ෂක ගාස්තු පිළිවෙලින් රු.1,650,711 කින් හා රු.1,766,265 කින් අඩුවුවද, ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.1,835,740 කින් හා රථ වාහන අංගනයේ ආදායම රු.687,256 කින් අඩුවීම සහ වැටුප් හා දීමනා රු.2,969,012 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) රථ වාහන අංගනයේ ආදායම් රැස්කිරීම.

(i) වෙළඳ සංකීර්ණ පරිශ්‍රයේ රථවාහන අංගනයේ ආදායම් එකතු කිරීමේ කටයුතු භාරය විසින් ලංකා ධීවර සංස්ථාව වෙත පවරා තිබූ අතර, භාරයේ අනුමැතියකින් තොරව ධීවර සංස්ථාව එම කාර්ය සඳහා තෙවන පාර්ශවයක් වූ සමාගමක් සමඟ වසර 10 ක දීර්ඝ කාලීන ගිවිසුමකට එළඹ තිබුණි.

(ii) 2013 දෙසැම්බර් 10 දිනැති කළමනාකරණ භාර මණ්ඩල රැස්වීමේදී මෙම ගිවිසුම සංශෝධනය කර 2014 මාර්තු දක්වා පමණක් ක්‍රියාත්මක කර අනතුරුව නැවත මිලගණන් කැඳවා ආයතනයක් තෝරා ගැනීමට සැලසුම් කර තිබුණ ද, විගණිත දිනය දක්වාම ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(iii) සමාගමේ 2013/2014 හා 2014/2015 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන පිටපත් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.4,930,948ක් වූ කළමනාකරණ භාරයේ රථවාහන ගාල් කිරීමේ ආදායමේ නිරවද්‍යතාවය විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(iv) රථ වාහන අංශයේ ආදායම වෙනුවෙන් සමාගම ගෙවා තිබූ එකතු කළ අගයමත බදු රු.1,703,342 ක් හා ජාතිය ගොඩනැගීමේ බදු රු. 283,890 ක් වියදම් වශයෙන් අඩුකර තිබුණද අදාල ගෙවීම්, බදු ප්‍රේෂණ වාර්තා මගින් තහවුරු කර නොතිබුණි.

(v) 2011 , 2012 හා 2013 වර්ෂවලට අදාලව සමාගම විසින් අයකර ගෙන ලංකා ධීවර සංස්ථාවට ප්‍රේෂණය කරනු ලැබූ ආදායමෙන්, භාරයට අයවිය යුතු රු. 18,398,680 ක්, ධීවර සංස්ථාව වෙතින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

#### (ආ) වෙළඳසැල්වල කුලී ආදායම රැස්කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපාරික ස්ථාන සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබූ තක්සේරු වටිනාකමට වඩා අඩුවෙන් බදුකුලී අය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී රු. 36,960,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ii) භාරය සතු දේපල කුලියට දීමේදී ආපසු ගෙවනු ලබන ඇප තැන්පතුවක් ලබා ගැනීමට කටයුතු කර තිබුණද, ලංකා ධීවර සංස්ථාවට හා තොග වෙළඳසැලට අනුබද්ධ දේපල කුලියට දීමේදී එකතුව රු.14,020,000 ක් වූ ඇප මුදල් අදාළ පාර්ශව වෙතින් ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම දේපල වලට වන හානිය පියවා ගැනීම හා හිඟ බදුකුලිය අයකර ගැනීම සම්බන්ධයෙන් වන අවධානම භාරයට දැරීමට සිදුවී තිබුණි.

(iii) කුළියට දීම සඳහා ඉදිකර තිබූ සිල්ලර වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ මාසික තක්සේරු වටිනාකම රු.14,000 බැගින් වූ වෙළඳසැල් 02 ක් පොලිස් නිලධාරීන්ගේ පරිහරණය සඳහා ද, තවත් වෙළඳ සැලක් ආපනශාලා සේවකයන්ගේ පරිහරණය

සඳහා ද, ගාස්තු අය කිරීමෙන් තොරව ලබාදී තිබීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා රු.504,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

**(ඇ) පරිශ්‍රයේ අපද්‍රව්‍ය ඉවත් කිරීම**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වෙළඳ සංකීර්ණයේ ඉවත දමන අපද්‍රව්‍ය යොදාගෙන සත්ව ආහාර හා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමට නිෂ්පාදනාගාරයක් ඉදිකර ගැනීම සඳහා මාසික කුලියක් මත භූමි පරිශ්‍රය පෞද්ගලික සමාගමකට 2014 අගෝස්තු 20 දින ගිවිසුමක් මගින් ලබා දී තිබුණි. මෙකී ගිවිසුම වසර 15ක් තරම් වන දීර්ඝ කාලයකට එළඹ තිබු අතර වසර 15 සඳහාම අයකල යුතු මාසික කුලිය ප්‍රමාණවත් පරිදි සංශෝධනයකින් තොරව ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී තීරණය කර තිබුණි.

(ii) අදාල සමාගමේ නිෂ්පාදන අමුද්‍රව්‍ය වශයෙන් වෙළඳ සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය ලබා ගැනීමට අවස්ථාව සලසාදී තිබියදී එම අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා මාසිකව රු.519,000 බැගින් අදාල සමාගමට ගෙවා තිබුණි.

(ඈ) වෙළඳ සංකිර්ණ පරිශ්‍රය තුළ පිහිටි ගොඩනැගිලි කීහිපයක අත්තිවාරම්වල කොන්ක්‍රීට් තට්ටුවට යටින් පොළව ගිලාබැස තිබු අතර, එය පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට රු.628,120 ක් ගෙවා තිබුණි. එම වාර්තාව විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, භූමිය යථාතත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වෙළඳ සංකිර්ණ පරිශ්‍රය පිරිසිදු කිරීමේ කටයුතු පවරන ලද සමාගම සමඟ එළඹ තිබු ගිවිසුමට, පිරිසිදු කිරීමේදී අධි පීඩන ජල විදුලි උපකරණ භාවිතා කළ යුතු බවට වු කොන්දේසිය ඇතුළත් කර නොතිබුණි. එම පිරිසිදු කිරීමේ කටයුතු සඳහා සාමාන්‍ය ජල නල භාවිත කිරීම නිසා සිදු වු අධික ජල පරිභෝජනය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජල බිල්පත් සඳහා රු.7,077,668 ක් වැය වී තිබුණි.

(ඊ) භාරයේ මූල්‍ය ප්‍රකාශන අනුව, ලංකා ධීවර සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු.18,410,373 ක් ව පැවතියදී ලංකා ධීවර සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශන අනුව භාරයට ගෙවිය යුතු මුදල රු.8,527,521 ක් වීමෙන් ඇතිවී තිබු රු. 9,882,852 ක වෙනස හඳුනාගෙන ඒ සඳහා ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

**4.2 දෘශ්‍ය අක්‍රමිකතා**

------------------

**(අ) ආරක්ෂක සේවාව සඳහා ගෙවීම්**

-----------------------------------

(i) වෙළෙඳ සංකීර්ණයට ආරක්ෂාව සපයනු ලබන පෞද්ගලික ආරක්ෂක සේවා සමාගම විසින් ආරක්ෂක කටයුතු සඳහා එක් සේවා මුරයකට නිලධාරීන් 9-12 අතර ප්‍රමාණයක් යොදවා තිබුණද නිලධාරීන් 24 දෙනෙකු යෙදවූ බවට සඳහන් කරමින් ඉදිරිපත් කරතිබු බිල්පත් සඳහා භාරය විසින් 2011 ජුනි 01 සිට 2013 ඔක්තෝබර් 31 දක්වා රු.17,592,003 (බදු සහිත) ක් ද, සමාලෝචිත වර්ෂයේ මාස 4 ක් සඳහා රු.113,100 ක් ද වැඩිපුර ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පෙර විගණන වාර්තා මගින් පෙන්වා තිබුනද එම මුදල් අයකිරීම සම්බන්ධව භාරය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) 2011 මාර්තු 31 සිට 2015 මාර්තු 30 දක්වා වසර 4ක කාලයක් ආවරණය වන පරිදි 2014 ජනවාරි 08 දින මෙම ආරක්ෂක සේවා සමාගම සමඟ භාරය ගිවිසුමකට එළඹ තිබූ අතර

2015 ජුනි 30 දක්වා භාරයේ අනුමැතිය මතද 2015 දෙසැම්බර් 31 දක්වා භාරයේ අනුමැතිය රහිතවද මෙම ගිවිසුමේ කාලය දීර්ඝ කර තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපන ශාලාව සඳහා 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.1,143,868 ක් වූ ශීතකරණ 03 ක් මිලදී ගත් දින සිටම භාවිතයට ගැනීමෙන් තොරව ආපන ශාලාව තුළ තබා තිබුණි.

(ආ) වෙළඳසැල් 128 කින් යුතු වූ සිල්ලර වෙළඳ සංකීර්ණයේ වෙළඳසැල් 98 ක් විගණිත දින වූ 2015 නොවැම්බර් 30 දින වන විටත් උපයෝජනය කිරීමක් තොරව පැවතුණි.

**4.4 හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය තුල තොග ගොඩනැඟිලි සංකීර්ණයේ පොළොවෙහි ප්‍රමිතියෙන් තොර වූ තීන්ත ආලේප කිරීම නිසා මාස කීපයක් තුල එම තීන්ත ඉවත්වී තිබීම හේතුවෙන් සිදුවී තිබුණු රු.2,314,160 ක අලාභය වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

(ආ) 2012 වර්ෂයේ රු. 771,049 ක් වැය කර ඉදිකර තිබූ අපද්‍රව්‍ය ටැංකිය, එම භූමිය බදු දීම සඳහා ඉවත් කර තිබීම හේතුවෙන් භාරයට සිදු වී තිබූ පාඩුව රු. 747,917 ක් විය.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙළඳ සංකීර්ණය ආරම්භ කර වසර 4 ක් ඉක්මවා තිබුණද අවශ්‍ය තනතුරු හඳුනාගෙන අනුමත කරවා ගැනීමටත්, සංවිධාන සටහනක් සකස් කර ගැනීමටත් ක්‍රියාකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.2 උපවගන්තියට අනුව පත් කිරීමක් කළ හැක්කේ අනුමත තනතුරකට පමණක් වුවද, භාරය සඳහා අනුමත කරගෙන නොතිබූ තනතුරු වෙනුවෙන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් තිදෙනෙකු වැඩ බැලීමේ හා රාජකාරී ආවරණය කිරීමේ පදනම මත 2011 හා 2012 වර්ෂ වලදී පත්කර තිබුණු අතර, එම නිළධාරීන් භාරයේ දැරූ තනතුරු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ පාරිශ්‍රමිකයන් වශයෙන් රු. 1,309,320 ක් ගෙවා තිබුණි. තවද, මෙම පත්කිරීම් ආයතන සංග්‍රහයේ 6 වැනි පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සිදුකර නොතිබුණු අතර පාරිශ්‍රමිකයන්ද ආයතන සංග්‍රහයේ හා අනෙකුත් චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනි ආකාරයට තීරණය කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පී එෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී මාස 2ක් ඇතුළත භාරයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්

සමාලෝචිත වර්ෂය සඳහා භාරයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2015 ඔක්තෝබර් 06 දින, එනම් මාස 8ක කාල ප්‍රමාදයකින් පසුවය.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

## 5.4 නොවිසඳී ඇති විගණන ජේද

2014 හා 2015 වර්ෂවලදී කඩකුලී ආදායම්, වාහන අංගනයේ ආදායම් රැස් කිරීම, වැටුප් ගෙවීම්, ආරක්ෂක සේවා, පිරිසිදු කිරීමේ සේවා, අපද්‍රව්‍ය ඉවත් කිරීමේ වියදම් හා අපද්‍රව්‍ය ටැංකිය ඉවත් කිරීමේ අලාභය ආදී වශයෙන් එකතුව රු.89,014,188 ක්වූ විගණන විමසුම් 18 ක් සම්බන්ධයෙන් 2015 නොවැම්බර් 30 දින දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ගෙවීම්
(ඇ) වත්කම් නඩත්තුව